**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

**(අ)** රු.449,361 ක්වූ හිඟහිටි උසාවිදඩ ලැබීම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ආ)** පුරනැගුම ව්‍යාපෘතිය මඟින් 2014 වර්ෂයේදී සභාව වෙත ලබා දී තිබුණ පරිගණක 02 ක සහ අදාළ උපාංග වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

**(ඇ)** ඉකුත් වර්ෂ තුන වෙනුවෙන් ප්‍රතිපාදිත මුද්දර ගාස්තු ප්‍රමාණය ඉක්මවා ලැබුණු රු.866,690 ක් සඳහා අදාළ ගැළපීම් නොකිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා ලැබිය යුතු මුද්දර ගාස්තු එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**-------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.794,018 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,713,359 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**-----------------------**

**2.2.1 වරිපනම් බදු**

**--------------**

බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන ඇති ප්‍රදේශ වල පිහිටි නිවාස හා දේපළ වටිනාකම තක්සේරු කර නිසි ලෙස දැන්වීම් කර අදාළ වරිපනම් බදු ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ**

**------------**

සභාව වෙත මාසිකව අය විය යුතු උසාවි දඩ ආදායම් පිළිබඳව අදාළ උසාවියේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් තහවුරු කිරීම් ලබාගෙන උසාවි දඩ ආදායම් නිශ්චය කර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

---------------

සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 04 කට අදාළව සභාව වෙත අය විය යුතු මුද්දර ගාස්තු ආදායම් නිසි ලෙස හඳුනාගෙන අයකර ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

2.2.4 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

---------------------------------

සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා ප්‍රතිපාදන 2013 නොවැම්බර් 29 දින ගැසට් නිවේදනයේ පල කර තිබුණද ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරු මඟින් ආදායම් අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

**(අ)** සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ බැහැරට යාමේදී විධිමත් අනුමැතියක් යටතේ නිසි ක්‍රම වේදයකට අනුව සිදු නොවන බව අනාවරණය වූ අතර ආදායම් උත්පාදන කාර්යයයේ යෙදවිය හැකි වාහන හා යන්ත්‍ර මඟින් ආදායම් උපයා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**(ආ)** (203 වන අධිකාරය,) මෝටර් වාහන පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව ධාවනයට ප්‍රථම සියළු වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත් දීර්ඝ කාලයකට පෙර සභාව වෙත ලැබී තිබුණු ජල බවුසර් 02 ක් ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුණි.

**(ඇ)** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි

3.2 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

සභාව සතු රු.500,000 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂයේදී නිශ්ක්‍රීයව පැවතුණි.

**04.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය